**ශීර්ෂය 211 - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්වාගණනය කළ විගණන මතය

---

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණ මා ප්‍රකාශ කරමි.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ)භාණ්ඩාගාර වත්කම් වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත උපකරණවල ශේෂය රු. 619,376,286 ක් වූ නමුදු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එය රු. 990,637,130 ක් විය. මේ අනුව රු. 371,260,844 ක වෙනසක් අනාවරණය වේ. | 2017 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.3 ඡේදයේ සඳහන් විධිවිධාන වලට අනුකූලව කටයුතු කළයුතු වේ. | මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වාර්තාවල ඇතුළත් කර ඇත්තේ පසුගිය වර්ෂයේ විසර්ජන ගිණුමට අනුව අවසාන වත්කම් ශේෂයට අදාළ වර්ෂයේ මිලදී ගැනීම හා ඉවත් කිරීම ගැලපීමෙන් පසුව ලබාගත් ශේෂයයි. භාණ්ඩාගාර වත්කම් වාර්තාවලට අදාළ කරගෙන ඇත්තේ 2018 වර්ෂයේදී CIGAS පරිගණක වැඩසටහනට මිලදී ගනු ලබන වත්කම්වල අගයන් ඇතුළත් කළ පසු ලබාගත් ශේෂයයි. මෙම ශේෂය තුළ පැරණි වත්කම්වල අගයන් ඇතුළත් නොවන අතර එම වත්කම් මෙම වැඩසටහනට ඇතුළත් කිරීම සඳහා අගය කරමින් පවතින අතර ඒවා අගය කිරීමෙන් අනතුරුව වැඩසටහනට ඇතුළත් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. මෙම ශේෂ වර්ග දෙක සැසඳුම් කිරීමේ හැකියාවක් නොමැති බවද තවදුරටත් දන්වමි. |
| (ආ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනතේ 22.6 (11) වගන්තිය ප්‍රකාරව එකතු කළ අගය මත බදු අය කිරීමට අදාළ සැපයීම් අගය මත එකතු අගය මත බදු ප්‍රමාණයට පමණක් ගණනය කල යුතු අතර දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලදී මිලදීගත් සැපයුම් භාණ්ඩ වෙනුවෙන් ගෙවා තිබුණු එකතු කළ | 2002 අංක 14 දරණ එකතු කල අගය බදු (සංශෝධිත) පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම. | |

අගය මත බදු ප්‍රමාණය රු. 291,158,028 ක් ලෙස උපචිතව තිබුණි.

**(ආ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීම. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව වාර්තා පිළියෙල කර ඇති අතර එම චක්රලේඛ වාර්ෂික මූල්‍ය වාර්තාව සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට උපදෙස් ලබාදී නොතිබුණි. |
| | | වහා ගිනි ඇවිලෙන ද්‍රව්‍යයක් වන කඩදාසි විශාල වශයෙන් භාවිතා කරනු ලබන ස්ථානයක් වන බැවින් ගිනි අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතියක් ආයතනය තුළ ස්ථාපිත කිරීම සහ හදිසි අවස්ථාවකදී ආරක්ෂාව සඳහා ගමන් කළ යුතු මාර්ග පැහැදිලිව සංඥා මඟින් දැක්වීම. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව තුළ ගිනි අනතුරු ඇඟවීමේ සංඥා |

| | | | |
|---|---|---|---|
| 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනතේ 41 වන වගන්තිය | හදිසි අවස්ථාවකදී ගිනි අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතියක් ආයතනය තුළ ස්ථාපිත කර නොතිබුණි.<br><br>හදිසි අවස්ථාවකදී ආරක්ෂාව සඳහා ගමන් කළ යුතු මාර්ග පැහැදිලිව සංඥා මඟින් දක්වා නොතිබුණි. | | පද්ධතියක් ස්ථාපිත කිරීම පිණිස, කොළඹ මහ නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට ස්ථානීය පරීක්ෂාවක් සිදුකළ නමුත්, එහිදී අනාවරණය වූයේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඇතුළත ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර ධාවනය වන බැවින් ඒවායින් පිටවන දුම් නිසා නිරතුරුව මෙම ගිනි අනතුරු ඇඟවීමේ සංඥා පද්ධතිය ක්‍රියාත්මක විය හැකි බැවින්, එවැනි සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම ප්‍රායෝගික නොවන බවයි. මේ සඳහා සුදුසු ප්‍රායෝගික ක්‍රමවේදයක් ලෙස මේ වන විට අනෙකුත් ගිනි නිවීමේ උපකරණ ($H_2O$, $CO_2$, Foam, Powder) සහ අධි පීඩන ජල කරාම මේ වන විට දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ ස්ථාපිත කර ඇත. |
| 2017 සැප්තැම්බර් 01 දිනැති අංක 2034/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ දැක්වෙන 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වන වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 23 එ හා 23 ඒ වගන්ති | මුද්‍රණ කටයුතු ඉටු කිරීමේදී ඉතිරි වන ප්ලාස්ටික් භාජන එළිමහනේදී පිළිස්සීම නොකළ යුතු වුවත් එසේ සිදු කර තිබුණි. | ජාතික පරිසර පනතට අනුව කටයුතු කිරීමට නීතිමය වශයෙන් බැඳී ඇති බැවින් ඒ අනුව කටයුතු කිරීම. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගන්නා අමුද්‍රව්‍යයක් වන තීන්ත, භාවිතා කිරීමෙන් අනතුරුව ඒවා අඩංගු ප්ලාස්ටික් කෑන් අපහරණය කිරීම බලවත් ගැටළුවක්ව පවතී. මෙම තීන්ත අඩංගු හිස් ප්ලාස්ටික් කෑන් රජයට ආදායමක් උපයා ගැනීම සඳහා විකිණීම පිණිස අවස්ථා කිහිපයකදීම උත්සාහ කළ නමුත්, ඒ සඳහා කිසිදු පාර්ශවයක් මිල ගණන් ඉදිරිපත් නොකිරීම මත එය ව්‍යර්ථ විය. ඒ අනුව දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ එක්රැස්ව තිබූ හිස් ප්ලාස්ටික් කෑන් යම් ප්‍රමාණයක් මදුරුවන් බෝවීම වැළැක්වීම පිණිස පුළුස්සා දැමීමට සිදුවූ බව කාරුණිකව දන්වමි. නමුත් මේ වන විට අදාළ |

| | | | |
|---|---|---|---|
| | | | ප්ලාස්ටික් කැන් පුළුස්සා දැමීම නවතා දමා ඇති අතර, කොළඹ මහ නගර සභාව සමඟ සාකච්ඡා කොට මෙම ප්ලාස්ටික් කැන් අපහරණය සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගැනීමට මේ වන විට අවශ්‍ය පියවර ගනිමින් පවතී. ඒ අනුව මෙම ගැටළුව වඩාත් ප්‍රායෝගික පසුබිමක් තුළ කළමනාකරණය කරගත හැකි වන බව විශ්වාස කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය
------------------------

### 2.1 ආදායම් කළමනාකරණය
----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී බිල් කරන ලද මුළු මුද්‍රණ ආදායම රු. 1,018,388,626 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ඉන් සියයට 39 ක් වූ රු. 399,537,982 ක ආදායම් හිඟහිටව පැවතුණි. | මු. රෙ. 208 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙනුවෙන් සිදුකරනු ලබන මුද්‍රණ කටයුතු වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන එම අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවලින් ලබාගෙන අදාල ගිණුම් එම ශීර්ෂ වලට හර කර ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම. | මෙම හිඟ ආදායම් අයකර ගැනීමට අදාළ ආයතනවලට ලිපි මඟින් දැනුම් දී ඇති අතර ඒ අනුව අයකර ගැනීම් සිදුකරමින් පවතී. |
| (ආ) | (i) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට 2009 වර්ෂය හා ඊට පෙර වර්ෂ සඳහා හිඟ ශේෂය රු. 165,768,304 ක් වූ | අදාළ ණයගැතියාගෙන් මුදල් ලබාගත නොහැකි නම් වගකිව යුතු දෙපාර්තමේන්තු | පැරණි වර්ෂවලට අදාළ හිඟ ණය ශේෂ අයවීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පවතින අතර හිඟ ණය ගෙවීම් කරන ලෙස මෙම දෙපාර්තමේන්තුව මඟින් කරනු |

| | | | |
|---|---|---|---|
| | අතර එයින් රු. 87,136ක් පමණක් දෙපාර්තමේන්තුව විසින් අය කර ගෙන තිබුණි. | නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ගෙන් අයකර ගැනීම. | ලබන දැන්වීම් සඳහා බොහෝ ආයතන වලින් ලැබෙන ප්‍රතිචාරය ඉතා දුර්වල මට්ටමක පවතී. |
| | (ii) 2018 ජනවාරි 01 දිනට වූ ණයගැති ශේෂයෙන් රු. 140,560,630 ක ශේෂය 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ හිඟ හිටි ණය ගැති ශේෂ වලින් පැන නැගී තිබුණි. එම ණයගැති ශේෂයන් සියයට 13 ක් වූ රු. 17,778,019 ක ශේෂයක් පමණක් අයකර ගෙන තිබුණි. | | |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ ගිණුම් පොත් අනුව රාජ්‍ය ආයතන 08 කින් 2018 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ණයගැති ශේෂය රු. 13,729,564 ක් වී තිබුණි. එම ණය ශේෂයෙන් එකතුව රු. 4,577,632 ක ණය ශේෂයක් පමණක් එම ආයතන විසින් සනාථ කර තිබුණු අතර රු. 9,151,932 ක ණය ශේෂ සනාථ කර නොතිබුණි. | මු. රෙ 208 හි සඳහන් විධිවිධාන අනුගමනය කර අදාළ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කිරීම. | දෙපාර්තමේන්තු පොත්පත් අනුව අයකරගත යුතු ශේෂයන් නිවැරදිව සඳහන් කර ඇති අතර අදාළ ආයතනයන්ගෙන් ලැබෙන පිළිතුරු නිවැරදි නොවන බව පෙනීයයි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙනුවෙන් විෂයයන් 04 කින් පාසල් පොත් පිටපත් | පාසල් පොත් එකඟ වූ වේලාවට මුද්‍රණය කිරීමට වැඩ පිළිවෙලක් සැලසුම් කිරීම | අදහස් දක්වා නැත. |

| | | | |
|---|---|---|---|
| | 1,277,000 ක් මුද්‍රණය කර තිබූ අතර ඒ වෙනුවෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව ලද ආදායම රු. මිලියන 110 ක් විය. එයින් සියයට 19 ක් වූ රු. මිලියන 21 ක් එකඟ වූ දිනයට වඩා ප්‍රමාද වී පොත් මුද්‍රණය කර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට භාර දීම නිසා එම දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතු මුදලින් අඩුකර තිබුණි. | | |
| (ආ) | මෙලෙස පොත් ප්‍රමාද වී මුද්‍රණය කර තිබූ නමුදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 1112 කට එකතුව රු. 4,762,800 ක් පාසල් පොත් මුද්‍රණ දීමනාව ලෙස සමාලෝචිත වර්ෂයේදී වැටුපට අතිරේකව ගෙවා තිබුණි. | පාසල් පොත් මුද්‍රණ දීමනාව වැටුපට අමතරව දෙනු ලබන දීමනාවකි. එබැවින් කාර්යක්ෂමව මුද්‍රණ කටයුතු සිදු කරවා ගැනීමට කළමණාකරණයට හැකියාවක් තිබිය යුතුවීම. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පාසල් පොත් දීමනාව ගෙවනු ලබන්නේ ඒ ඒ වර්ෂයට අදාළ පාසැල් පොත් මුද්‍රණය කර අවසන් කිරීම වෙනුවෙනි. මේ සඳහා ප්‍රමාද ගාස්තු අදාළ නොවේ. |
| (ඇ) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි රජයේ මුද්‍රණාලයීය සමුපකාර සමිතිය ආපන ශාලාව පවත්වාගෙන යනු ලැබේ. එම ආපනශාලාවේ සේවකයින් 26 දෙනෙකු පූර්ණ කාලීන වශයෙන්ද තිදෙනෙකු අර්ධකාලීනව යොදවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් එම කාර්යය මණ්ඩලය වෙනුවෙන් රු. 10,953,637 ක් කැලි පදනම මත දීමනා, අතිකාල දීමනා හා විශේෂ දීමනා ලෙස ගෙවා තිබුණි. | භෝජනාගාරය තරඟකාරී ටෙන්ඩර් පටිපාටිය මඟින් සුදුසු පාර්ශවයකට ලබාදීම හා මුද්‍රණ කාර්ය මණ්ඩලය එයින් ඉවත් කිරීම කළ යුතුවීම. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු ආපනශාලාව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි, රජයේ මුද්‍රණාලයීය භෝජනාගාර සමුපකාර සමිතිය විසින් පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව මෙම ආපනශාලාවේ සිදුවූ ගනුදෙනු සම්බන්ධව විධිමත් විගණනයක් පැවැත්වීමට මේ වන විටත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත දන්වා ඇති අතර, ඒ සම්බන්ධව ලබා දෙන වාර්තාව අනුව ඉදිරි පියවර ගනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඈ) | 2013 වර්ෂයේ සංශෝධිත මුද්‍රණ සේවා ව්‍යවස්ථාවේ 10.03.04 පරිච්ඡේදය අනුව | චක්‍රලේඛවල සඳහන් දීමනා පමණක් පුහුණුලාභීන්ට ගෙවීම් කළ | මෙම දෙපාර්තමේන්තුව කර්මාන්ත ශාලාමය පරිසරයක් සහිත දිවා රාත්‍රී වැඩ මුර 02කින් සමන්විත නිෂ්පාදන ආයතනයක් වන අතර |

| | | |
|---|---|---|
| මුද්‍රණ සේවයට, බාහිරින් බඳවාගත් ආධුනිකයන් වර්ෂ තුනක පුහුණු කාලයකට යටත් වන අතර ඒ කාලය තුළදී ඔවුන්ට දෛනිකව රු. 580 ක දීමනාවක් පමණක් ගෙවිය යුතු බවට දක්වා තිබුණි. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2015 අගෝස්තු 06 දිනැති අංක PC/6/5/094/3R දරන ලිපියේ විධිවිධාන ප්‍රකාරවද එම දෛනික දීමනාව සනාථ කර තිබියදී එම ආධුනිකයන්ට වෙනත් දීමනා හා අතිකාල දීමනා ලෙස එකතුව රු. 17,405,011 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | යුතුය. | යථෝක්ත ආධුනිකයින්ගේ සේවාව සාමාන්‍ය පැය 08ක සේවා කාලයකින් පසු ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. මේ අනුව මෙම පුහුණු ලාභීන්ට එක් දිනක් සඳහා ගෙවන රු.580 ක මුදල 8න් බෙදා ලැබෙන අගයට සමාන මුදලක් පමණක් පැයකට ගෙවීමට පියවර ගෙන ඇත. යම් හෙයකින් මෙම ආධුනිකයින් ලවා ඉටු කරවා ගත් කාර්යයන් වෙනත් ක්‍රමවේදයක් ඔස්සේ ඉටු කරවා ගැනීමට සිදු වූයේ නම් මීට වඩා අති විශාල මුදලක් වැය වනු ඇත. තවද මුද්‍රණ සේවා ව්‍යවස්ථා සැකසීමේදී සිදුවූ යම් යම් ප්‍රමාද දෝෂයන් මත මෙම ආධුනිකයන් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා දායක වුවත් ඊට සරිලන ප්‍රමාණවත් දීමනාවක් ගෙවීමට නොහැකි වී ඇති අතර ඉදිරියේදී ව්‍යවස්ථාව සංශෝධනයක් සිදු කර එමගින් සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවන බව දන්වමි. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළගා කර ගැනීමේ සූදානම පිළිබඳව දෙපාර්තමේන්තුව දැනුවත් වී නොතිබුණි. ඒ අනුව තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හදුනා ගැනීම, දර්ශක හදුනා ගැනීම, ඒ සඳහා මානව හා භෞතික සම්පත් වෙන් කිරීම, දත්ත රැස් කිරීම යනාදී ක්‍රියාවන් සිදු කර නොතිබුණි.<br>ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව දැනුවත් වී නොතිබීම හේතුවෙන් | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා එළඹීම සඳහා උපරිම දායකත්වය ලබා දීම. | අදහස් දක්වා නැත. |

එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම මැනබැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.